# USE OF MANAGEMENT ACCOUNTING

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

## ගිණුම්කරණයේ මූලික කොටස්

ගිණුම්කරණය මූලික වශයෙන් කොටස් දෙකකි.

1. මුල්‍ය ගිණුම්කරණය
2. කළමනාකරණ ගිණුම්කරණය

## කළමණාකරණ ගිණුම්කරණය

කළමනාකරණ ගිණුම්කරණය, කළමනාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීම, සැකසීම හා එම තොරතුරු කළමනාකරණයට ලබා දීමේ කාර්යය පද්ධතිය කළමනාකරණ ගිණුම්කරණය ලෙස සැකෙවින් හැඳින්වේ.

ClassWork.LK

# <u>කළමණාකරණ ගිණුම්කරණයේ නිර්වචනය</u>

වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය මගින් කළමණාකරණ ගිණුම්කරණය සම්බන්ධව ලබා දී ඇති නිර්වචනය පහත දැක්වේ.

‘‘කාර්යක්ෂමතාව උපරිම මට්ටමින් ඇති කර ගැනීම සඳහාත්, අනාගත සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය හා ප්‍රතිඵල මැනීම සඳහාත් තොරතුරු සැකසීම හා අර්ථකථනය සඳහාත් ගිණුම්කරණ හා සංඛ්‍යා ලේඛනාත්මක ශිල්පීය ක්‍රම භාවිතයට ගැනීම කළමනාකරණ ගිණුම්කරණය වේ’’

# කළමනාකරණ ගිණුම්කරණයේ අවශ්‍යතාව

- විවිධ කළමනාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සපයා දීම.
- ව්‍යාපාර පරිසර වෙනස්වීමට ගැළපෙන පරිදි ව්‍යවහාරික උපාය මාර්ග සැකසීමට උපකාරී වීම.
- සැලසුම් කළ තත්ත්වයන් හා සත්‍ය ක්‍රියාකාරි තත්ත්වයන් සැසඳීමෙන් ඒවායේ වෙනස්කම් හඳුනා ගැනීම හා නිවැරදි කිරීම් සිදු කිරීම.
- මෙහෙයුම් කටයුතුවල දී සිදු වන ගැටලු සඳහා වඩාත් යෝග්‍ය විසඳුම් ලබා දීම.
- ව්‍යාපාරයේ එක් එක් අංශවල කාර්යක්ෂමතාව ඇගයීම හා වාර්තා සැකසීම.
- අනාගත කටයුතු සැලසුම් කිරීමට යෝග්‍ය වන පරිදි අතීත හා අනාගත තත්වයන් පිළිබඳ තොරතුරු සැපයීම.

ClassWork.LK

# කළමනාකරණ තීරණ ගැනීමේ දී අවධානයට යොමු කළ යුතු කාර්යයන්

ආයතනයක කළමනාකාරිත්වය විසින් කළමනාකරණ තීරණ ගැනීමේ දී අවධානයට යොමු කළ යුතු කාර්යයන් පහත දැක්වේ.

- මූල්‍ය ගිණුම්කරණය හා පිරිවැය ගිණුම්කරණය මගින් කළමනාකරුවන්ට අවශ්‍ය තොරතුරු සපයා ගැනීම
- සපයා ගත් තොරතුරු අදාළ පරිදි වර්ග කිරීම හා විශ්ලේෂණය
- මූල්‍ය තොරතුරු, පිරිවැය තොරතුරු හා වෙනත් ක්ෂේත්‍රවලින් ලබා ගත් තොරතුරු කළමනාකරුවන්ට අවශ්‍ය ආකාරයට සැකසීම
- සකස් කරන ලද තොරතුරු සාරාංශ කර වාර්තා පිළියෙල කිරීම
- කළමනාකරණ කටයුතු සඳහා විවිධ අයවැය සකස් කිරීම
- අයවැය හා සත්‍ය තත්වයන් සැසඳීම හා වාර්තා සැකසීම

ClassWork.LK

# කළමනාකරණ ගිණුම්කරණ හා මූල්‍ය ගිණුම්කරණ අතර වෙනස්කම්

| පදනම් / නිර්ණායක | කළමනාකරණ ගිණුම්කරණය | මූල්‍ය ගිණුම්කරණය |
| --- | --- | --- |
| • තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශ්ව | කළමනාකරුවෝ/ අභ්‍යන්තර පාර්ශ්ව | බාහිර හා අභ්‍යන්තර පාර්ශ්ව |
| • තොරතුරුවල ස්වභාවය | මුදලින් මැනිය හැකි වුත්, මුදලින් මැනිය නොහැකි වුත් කළමනාකරණ තීරණවලට අදාළ වන තොරතුරු | මුදලින් මැනිය හැකි මූල්‍ය තොරතුරු |
| • නෛතික අවශ්‍යතාව | නෛතික අවශ්‍යතාවක් නොවේ. | නෛතික අවශ්‍යතාවක් වේ. |
| • අවධානයට යොමු කෙරෙන කාලය | අනාගතය, වර්තමාන කාලය, පිළිබඳව | අතීත ක්‍රියාකාරිත්වය පිළිබඳව |
| • වාර්තා ආවරණ කෙරෙන කාලය | නිශ්චිත කාල වකවානුවක් වෙනුවෙන් වාර්තා පිළියෙල කිරීමක් සිදු නොකෙරේ. අංශ හෝ වෙනත් පදනම් මත වාර්තා සැකසීමක් සිදු වේ | සාමාන්‍යයෙන් ගිණුම් කාල වකවානුවක් සඳහා වාර්තා සැකසීමක් සිදු වේ. |

ClassWork.LK

| | | |
|---|---|---|
| • පිළිගත් මූලධර්ම, සංකල්ප කෙරෙහි යොමු වීම | කළමනාකරණ අවශ්‍යතා මත පදනම් වේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ආදියට අනුකූලව වාර්තා සකස් කළ යුතු ය. |
| • වාර්තා සැකසීම සිදුවන ක්ෂේත්‍රය | සමස්ත ආයතනය ම එක් වරම සැලකිල්ලට නො ගනී. එක් එක් අංශය හෝ ක්ෂේත්‍රයන් පිළිබඳව වෙන වෙන ම සැලකිල්ලට යොමු කරනු ලබයි. | සමස්ත ආයතනය ම සැලකිල්ලට ගෙන, ඒකකයක් ලෙස සලකා වාර්තා පිළියෙල කෙරේ. |
| • අනෙකුත් ක්ෂේත්‍ර හා සම්බන්ධතාව | ගිණුම්කරණ ක්ෂේත්‍රය ඉක්මවන ආර්ථික විද්‍යාව, සංඛ්‍යා ලේඛන විද්‍යාව, මූල්‍යකරණය ආදි විෂයයන්ගේ අවශ්‍යතාව සඳහා ද තොරතුරු සැකසීම | ගිණුම්කරණ ක්ෂේත්‍රයට පමණක් සීමා වේ. |

ClassWork.LK

# අභ්‍යාසය

1) ගිණුම්කරණයේ ප්‍රධාන ක්ෂේත්‍ර දෙක කවරේ ද?

2) කළමනාකරණ ගිණුම්කරණය යන්නෙහි අදහස පැහැදිලි කරන්න.

3) තීරණ ගැනීමේ දී අවධානයට යොමු කෙරෙන කළමනාකරණ කාර්යයන් මොනවාද?

4) කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස්කම්, නිර්ණායක ඔස්සේ ඉදිරිපත් කරන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura